2022 ජනවාරි 12

ප්‍රවෘත්ති කර්තෘ/ සංස්කාරක,

වෙනසකට මගක්

පැෆ්රල් සංවිධානය ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලන ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් විශේෂයෙන්ම පාර්ලිමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන තුළ කාන්තා නියෝජනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉහළ නැංවීම සඳහා පුහුණු පාඨමාලාවක් දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සිදු කිරීමට සැළසුම් කර ඇත.

ඒ අනුව එහි පළමු අදියර සඳහා දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දැනට දේශපාලනයේ නියැලී සිටින හෝ නියැලීමට අපේක්ෂා කරන නායකත්ව ගුණාංගවලින් හෙබි සහ යම් මහජන පදනමක් සහිත කාන්තාවන් 400 ක් පමණ අයදුම් කර තිබූ අතර මෙම පාඨමාලාව සඳහා පිරිස තෝරා ගැනීම හා මෙහෙයවීම සඳහා 12 දෙනෙකුගෙන් සමන්විත දේශපාලන අත්දැකීම් සහිත උපදේශන මණ්ඩලයක් ක්‍රියාත්මක විය. මෙහිදී ලැබී තිබූ අයදුම්පත් අතුරින් අදියර දෙකක් යටතේ ඉතාමත් විනිවිදභාවයක් සහිත ක්‍රමවේදයකට අනුව 100 දෙනෙකු තෝරාගනු ලැබීය.

පළමු අදියරේදී නිර්ණායක 06ක් සැලකිල්ලට ගනිමින් 261 ක් දෙනෙකු හඳුනාගත් අතර දෙවන අදියරේදී එම පිරිස සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරන ලදි. ඒ සඳහා විෂය දැනුම හා ප්‍රායෝගික අත්දැකීම්වලින් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩල 12 ක් පත්කළ අතර එම මණ්ඩල හරහා මෙම පිරිස තෝරා ගනු ලැබීය.මෙම තෝරා ගැනීම අතිශය තරගකාරී වූ අතර දෙවැනි වටය සඳහා ඉදිරිපත් වූ බහුතරයක් සමාන සුදුසුකම් සහිත පිරිසක් වූ අතර එම පිරිසෙන් දේශපාලන පක්ෂ, දිස්ත්‍රික්ක, ජනවර්ග ආදිය සැලකිල්ලට ගනිමින් 100 දෙනෙකු තෝරා ගැනීමට සිදුවිය. මෙම පාඨමාලාවට නොතේරුණු පිරිස නුසුදුස්සන් නොවන අතර එම කණ්ඩායම් සඳහා ඉදිරියේදී පුහුණු පාඨමාලාවන් සංවිධානය කිරීම පිළිබඳවද අවධානය යොමු කර ඇත.

සිංහල මාධ්‍යයෙන් 66 දෙනෙක් සහ දෙමළ මාධ්‍යයෙන් 34 ක් අප විසින් තෝරා ගත් අතර මෙම පාඨමාලාව තුළදී දේශපාලන ක්‍රියාවලිය, නායකත්වය, පෞරුෂ වර්ධනය, භාෂාව හැසිරවීම, මහජන රැස්වීම් ඇමතීම , මාධ්‍ය හා තාක්ෂණය භාවිතය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා දීමට අපි බලාපොරොත්තු වෙමු.

එබැවින් පැෆ්රල් සංවිධානය කෙරෙහි විශ්වාසය තබමින් මෙම පාඨමාලාව සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ සියලු අපේක්ෂිකාවන්ට පැෆ්රල් සංවිධානයේ ස්තුතිය පිරි නමමු. ඉදිරියේදී ඔබ සියලුදෙනා සමගම ඔබගේ දේශපාලන ගමන්මගට ශක්තියක් වීමට අපි පෙනී සිටින බව අවධාරණය කරමු.

මෙම පුහුණු පාඨමාලාවෙහි සමාරම්භක උළෙල 2022 ජනවාරි 19 වන දින ප.ව. 2.30ට බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී (ලෝටස් කමිටු ශාලාව) ගරු කථානායකතුමන්ගේ ප්‍රධානත්වයෙන් සහ සියලු දේශපාලන පක්ෂවල නායකයන්ගෙන් සහ පාර්ලිමේන්තුවේ කාන්තා සංසදය, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, සිවිල් සමාජ ක්‍රියාකාරීන් ඇතුලු සම්භාවණීය අමුත්තන් සහභාගී කරමින් පැවැත්වීමට අපේක්ෂා කරමු.

වෙනසකට මගක් අපේක්ෂා කරන මෙම පාඨමාලාව ආරම්භ කිරීමට පෙර එම අපේක්ෂිකාවන් 100 දෙනා මහජනතාවටත්, පක්ෂවලටත්, රටටත් හඳුන්වාදීම පිණිසත්, මෙම වැඩසටහන සමාජගත කිරීම පිණිසත් මෙම මාධ්‍ය සාකච්ඡාව පවත්වනු ලැබූ අතර එය සමාජගත කිරීම පිණිස ඔබ මාධ්‍ය ආයතනය කටයුතු කරන්නේ නම් එය අපට මහත් ශක්තියක් වනු ඇත.

ස්තුතියි.



රෝහණ හෙට්ටිආරච්චි,

විධායක අධ්‍යක්ෂ

2022 ஜனவாரி 12

செய்தி ஆசிரியர்கள் / பதிப்பாசிரியர்கள்,

**<u>மாற்றத்திற்கான பாதை</u>**

இலங்கை அரசியலில் பெண்களின் பிரதிநிதித்துவத்தினை அதிகரிக்கும் பொருட்டு, குறிப்பாக பாராளுமன்றம், மாகாணசபைகள் மற்றும் உள்ளூராட்சி மன்றங்களில் முடிவெடுக்கும் மட்டங்களில் பெண்களின் பிரதிநிதித்துவத்தினை அதிகரிப்பதற்கான முயற்சியியாக நாட்டின் அனைத்து மாவட்டங்களினையும் உள்ளடக்கும் வகையிலான கற்கைநெறி ஒன்றினை ஆரம்பிப்பதற்காக பவ்.ஃரல் அமைப்பு தீர்மானித்துள்ளது.

அதன் ஆரம்பகட்ட முயற்சியாக எமக்க கிடைக்கப்பெற்ற 400க்கும் மேற்பட்ட விண்ணப்பபடிவங்களிலிருந்து நாட்டின் அனைத்து மாவட்டங்களையும் உள்ளடக்கியதாக தற்போது அரசியலில் ஈடுபட்டுள்ள அல்லது எதிர்காலத்தில் அரசியலில் ஈடுபட எதிர்பார்த்துள்ள, தலைமைத்துவ பண்புகள் மற்றும் சமூகத்தில் வரவேற்புள்ள 100 பெண்கள், இரு நேர்காணல் சுற்றுகளினூடாக 12 பேர் உள்ளடங்கிய நடுவர் குழாமினரால் தமிழ் மற்றும் சிங்கள மொழி மூலமாக தெரிவுச் செய்யப்பட்டுள்ளனர்.

முதலாவது சுற்றில் 06 விதிமுறைகளின் அடிப்படையில் தெரிவுச் செய்யப்பட்ட விண்ணப்பதாரிகளில் இருந்து 2ம் சுற்றுக்காக 261 விண்ணப்பதாரிகள் தெரிவுச் செய்யப்பட்டனர். அவ்வாறு தெரிவுச் செய்யப்பட்ட 261 விண்ணப்பதாரிகள் இவ்விடயப் பரப்பு குறித்த அறிவு மற்றம் அனுபவமுடைய 12 நடுவர் குழுவினரால் நேர்காணல் செய்யப்பட்டு இறுதியாக 100 விண்ணப்பதாரிகள் தெரிவுச் செய்யப்பட்டனர். இத் தெரிவு முறையானது மிகவும் போட்டித்தன்மை வாய்ந்ததாக அமையப்பெற்றது. இரண்டாம் சுற்றுக்கு தெரிவுச் செய்யப்பட்டவர்கள் சமமான தகைமைகளை உடையவர்களாக காணப்பட்டதால், அவர்களது அரசியல் கட்சி, மாவட்டம், மற்றும் சனத்தொகையினை அடிப்படையாக கொண்டு 100 விண்ணப்பதாரிகள் தெரிவுச் செய்யப்பட்டனர். இக் கற்கை நெறிக்கு தெரிவுச் செய்யப்படாத விண்ணப்பதார்களுக்காக எமது நிறுவனத்தினால் எதிர்காலத்தில் பயிற்சி நெறிகளை ஏற்பாடு செய்ய நாம் எதிர்பார்த்துள்ளோம்.

மேலும், பஃவ்ரல் அமைப்பு தொடர்பில் நம்பிக்கை கொண்டு இக் கற்கைநெறிக்கு விண்ணப்பித்த அனைவருக்கும் எமது நிறுவனம் சார்பில் நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றோம். எதிர்காலத்தில் உங்கள் அனைவருடனும் உங்களுடைய அரசியல் பயணத்தினை பலப்படுத்தும் வகையில் நாம் இணைந்திருப்போம்.

சிங்கள மொழி மூலமாக 66 விண்ணப்பதாரிகளும், தமிழ் மொழி மூலமாக 34 விண்ணப்பதாரிகள் உள்ளடங்களாக இரு மொழி மூலமாகவும் 100 விண்ணப்பதாரிகள் தெரிவுச் செய்யப்பட்டுள்ள இக் கற்கைநெறி ஆளுமை விருத்தி, மொழி விருத்தி, பொது கூட்டங்களை நடாத்துதல் மற்றும் ஊடகம் மற்றும் தொடர்பாடல் கையாளுகை உள்ளடங்களாக செயன்முறைசார் அறிவு மற்றும் அனுபவத்தினை வழங்கவும் எதிர்பார்த்துள்ளோம்.

இக்கற்கை நெறி தொடர்பிலான அங்குரார்ப்பண நிகழ்வு எதிர்வரும், 2022 ஜனவரி மாதம் 19ம் திகதி பண்டாரநாயக்க ஞாபகார்த்த சர்வதேச மாநாட்டு மண்டபத்தில் பிற்பகல் 2.30 மணிக்கு கௌரவ. ஜனாதிபதி, பிரதமர், எதிர்கட்சி தலைவர், பாராளுமன்ற பெண்கள் குழு, அரசியல் கட்சிகள், பல்கலைக்கழக விரிவுரையாளர்கள், சிவில் சமூக செயற்பாட்டாளர்கள் உள்ளிட்ட பெருமை மிகு அதிதிகள் சூழ பிரமாண்டமாக நடாத்த திட்டமிட்டுள்ளோம்.

மாற்றத்திற்கான பாதையினை எதிர்பார்த்திருக்கும் இக்கற்கைநெறியினை ஆரம்பிப்பதற்கு முன்னதாக தெரிவுச் செய்யப்பட்டுள்ள நூறு வேட்பாளர்களையும் நாட்டு மக்களுக்கும். அரசியல் கட்சிகளுக்கும் எமது நாட்டிற்கும் அறிமுகப்படுத்தும் வகையிலாகவும் இக் கற்கைநெறி தொடர்பிலான விடயங்களைச் சமூகத்துக்கு கொண்டு சேர்க்கும் முகமாகவும் இடம்பெறவுள்ள ஊடக சந்திப்பினை சமூகப்பயப்படுத்துவதற்கான நடவடிக்கைகளை மேற்கொள்வீர்களாயின் அது எமது கற்கைநெறிக்கு பாரிய பலமாக அமையும் என்பது திண்ணம்.

நன்றி.

இப்படிக்கு,
உண்மையுள்ள,

ரோஹண ஹெட்டியாராச்சி
நிறைவேற்றுப் பணிப்பாளர்


#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com